<u>පුවත් නිවේදනය</u>

2013 ජූලි 23 දා කොළඹ දීය.

## "ලංකාපේ" පොදු ATM යාන්ත්‍රණයේ සමාරම්භය තුළින් බැංකු ගණුදෙනුකරුවන්ට අත්වන නව පහසුකම්

සී/ස ලංකාක්ලියර් (පුද්) සමාගම විසින් ATM ගනුදෙනුකරුවන් සඳහා පොදුවේ භාවිතා කළ හැකි යාන්ත්‍රණයක් "ලංකා පේ" (LankaPay) යන වෙළඳ නාමය යටතේ 2013 ජූලි 23 වන දින බත්තරමුල්ල වෝටර්ස් එජ් හිදී පැවති උත්සවයකදී හඳුන්වා දෙන ලදි. මෙහිදී ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සහ නියෝජ්‍ය අධිපති ආනන්ද සිල්වා මහතා විසින් ලංකා බැංකුවට සහ මහජන බැංකුවට අයත් ATM යන්ත්‍ර මගින් පළමු ගනුදෙනු සිදු කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව ලංකාක්ලියර් සමාගම විසින් ක්‍රියාත්මක කරන පොදු කාඩ්පත් හා ගෙවීම් යාන්ත්‍රණය (CCAPS) යටතේ පළමු අදියර ලෙස මෙම LankaPay පොදු ATM හුවමාරු යාන්ත්‍රණය (CAS) හැඳින්විය හැකි අතර මෙමගින් ශ්‍රී ලංකාවේ ATM ගනුදෙනු වල නව මං සලකුණක් සනිටුහන් වේ.

මෙහිදී කතා කළ ලංකාක්ලියර් සමාගමේ සභාපතිනිය ප්‍රියන්තා ලියනගේ මහත්මිය මෙසේ ප්‍රකාශ කළාය. "වේගවත් චෙක්පත් නිශ්කාෂනයත්" ශ්‍රී ලංකා අන්තර් බැංකු විද්‍යුත් ගෙවීම් ක්‍රමයත් හඳුන්වා දෙමින් කාර්යක්ෂම හා ආරක්ෂිත ගෙවීම් ක්‍රම සඳහා අපි අඩිතාලම යෙදුවෙමු. අප කරන සෑම කර්තව්‍යයකම අවසන් ඉලක්කය පොදුජනතාවට හා අපගේ සියලු පාර්ශවකරුවන්ට අනගි සේවාවක් ලබා දීමය. අද අපි තවත් පියවරක් ඉදිරියට යන්නෙමු. අද මුදල් ලබා ගැනීමට කොතෙක් දුර යායුතු දැයි යමෙක්ගෙන් ඇසුවහොත්" ඔබට නොයෙක් පිළිතුරු ලැබෙනු ඇත. මහජනතාවට වඩාත් පහසු ආරක්ෂිත හා ශක්තිමත් මූල්‍ය පදනමක් ඇති අනගිභවනීය සේවයක් ඔබ වෙත සලසා දීමේ හැකියාව දැන් අප සතුව පවතී. යුද්ධයෙන් පසු වඩාත් හොඳ අනාගතයක් සඳහා අපගේ මව්බිම නැවතත් එක්සත් වෙමින් පවතී. අපගේ මෙම එක්වීම ලාංකිකයන් නොයෙක් ආකාරයෙන් නොයෙක් අවස්ථාවන්හිදී විදහා දක්වා ඇත. අද ලංකාක්ලියර් ආයතනය ඔබට ඉදිරිපත් කරන දැයින් සංස්කෘතිය හා තාක්ෂණය එක්වීමේ ගුණාංග පිළිඹිබු කරනු ඇත".

පොදු කාඩ්පත් හා ගෙවීම් යාන්ත්‍රණය (CCAPS) යනු පොදු ATM යාන්ත්‍රණය (CAS)" වෙළඳසැල් වල පවතින POS යන්ත්‍ර භාවිතයෙන් පොදුවේ ගනුදෙනු කළ හැකි පොදු POS යාන්ත්‍රණය (CPS), පොදු ඉලෙක්ට්‍රොනික ගෙවුම් යාන්ත්‍රණය (CEFTS) සහ පොදු ජංගම දුරකතන මගින් කරන ගෙවුම් සඳහා යාන්ත්‍රණය (CMobS) යන සියල්ලම සංකලිතවූ පොදු ගෙවුම් යාන්ත්‍රණයකි. ලංකා බැංකුව සහ මහජන බැංකුව මෙහි මුල්ම සාමාජිකත්වය ලබා ගන්නා ලද අතර අනිකුත් බැංකු සහ මූල්‍ය ආයතනද දැනටමත්

මෙම පොදු යාන්ත්‍රණයට සම්බන්ධ වීමේ කටයුතු ආරම්භ කර ඇත. ඉදිරි මාස කිහිපය තුළදී අනෙකුත් සියලු බැංකු මෙම ජාලයට සම්බන්ධවීම තුළින් මෙම ජාලය ලංකාවේ විශාලතම පොදු ATM ජාලය බවට පත්වී ATM ගනුදෙනුකරුවන් හට මෙතාක් නොවූවිරූ පහසුවක් ලබා ගැනීමේ හැකියාව සලසා දී තිබේ.

අද සිට ලංකා බැංකුවට සහ මහජන බැංකුවට අයත් 900 කට අධික සියලු ATM යන්ත්‍ර අඩංගු ජාලයන් LankaPay පොදු ATM යාන්ත්‍රණයට සම්බන්ධ වන අතර එමගින් මෙම බැංකු දෙකෙහි ATM ගනුදෙනුකරුවන් හට ඉතා අඩු මුදලකට කාඩ්පත හිමි බැංකුවේ නොවන අනිත් බැංකුවෙහි ATM යන්ත්‍ර වලින් මුදල් ගැනීමට හැකිවනු ඇත. මෙලෙසම LankaPay පොදු ATM යාන්ත්‍රණයට ඉදිරියේදී සම්බන්ධවන සියලු බැංකු වල කාඩ්පත්හිමි ගනුදෙනුකරුවන්හට මෙම පහසුකම ලබා ගැනීමට හැකිවනු ඇත.

ලංකා බැංකු සභාපති" ජනාධිපති නීතිඥ රසීක් සරුක් මහතා ප්‍රකාශ කළේ මෙම ක්‍රමය තුළින් අප රට පුරා විහිදුනු ATM ජාලය හරහා පුළුල් සේවාවක් ඉතා පහසුවෙන් ලබා ගැනීමට හැකියාව ලැබෙන බවත්" ඒ සඳහා බැංකු අතරින් ශ්‍රී ලංකාවේ අංක 1 ලෙස සළකන ලංකා බැංකුව මෙම කර්තව්‍ය සාර්ථක කර ගැනීමට පුරෝගාමීව කටයුතු කළ බවත්ය. මහජන බැංකු අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික ආචාර්ය D J D ජයකොඩි මහතා සභාව අමතමින්" ශ්‍රී ලංකා මහ බැංකුව හා අනිකුත් සියලු බැංකු වලට අයත් ලංකාක්ලියර් සමාගම විසින් දියත් කරන ජාතික ATM යාන්ත්‍රණය හා අත්වැල් බැඳ ගැනීම ඉතා සතුටුදායක කරුණක් බව අවධාරණය කළේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික ගෙවුම් උපදේශක සභාවේ මග පෙන්වීම යටතේ දියත් කිරීමට යෙදුනු මෙම යාන්ත්‍රණය අපගේ සියලු ගනුදෙනුකාරභවතුන්ට නිසැකයෙන්ම වාසි ගෙනෙන බවට ඔහු විශ්වාසය පල කළේය. අනාගතයේ සියලු විද්‍යුත් ගෙවීම් සඳහා ප්‍රධානතම යටිතල පහසුකම මෙය වීම නොවැළැක්විය හැකි බවත් ලංකාවේ පුළුල්තම ආවරණයක් ඇති ජාතියේ බැංකුව ලෙස නම්ලත් මහජන බැංකුව මෙම කර්තව්‍යවයේදී ඉදිරියෙන් සිටීම මහත් සතුටක් වන බවත් ප්‍රකාශ කරමින් ඔහු මෙහි සාර්ථකත්වයට අත හිත දුන් සියලුම දෙනාට සිය ස්තුතිය පුදකර සිටියේය.

ජාතික පියවරක් ලෙස සියලු බැංකුවල සහභාගීත්වය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මගපෙන්වීම යටතේ ආරම්භ කර ඇති පොදු කාඩ්පත් හා ගෙවීම් යාන්ත්‍රණය විද්‍යුත් ගෙවීම් සඳහා පිළිගත් ජාත්‍යන්තර රීතීන්ද කැටිකොට ඇති නිසා අඩු වියදමකින් ආරක්ෂාකාරීව සහ පහසුවෙන් තම විද්‍යුත් මූල්‍ය ගනුදෙනු කිරීමට හැකියාව ලබා දෙනු ඇත. තවද මෙම පොදු යාන්ත්‍රණයට සම්බන්ධවන බැංකු තම ගනුදෙනුකරුවන් හට මේ තුළින් නව නිපැයුම් හඳුන්වා දීමට ඇති හැකියාවද ඉතා වැදගත් කොට සැලකිය හැක.

CCAPS හුවමාරු ස්විචය පූර්ණව දියත් කිරීම ශ්‍රී ලංකා ගෙවීම් ක්‍රම වල විප්ලවීය වෙනසක් වනවාට නොඅනුමානය. ශ්‍රී ලංකාවේ මහජනතාවට මෙමගින් කාර්යක්ෂම සහ ඵලදායී සේවාවන් රාශියක් තම ගනුදෙනු සඳහා භාවිතා කිරීමේ අවස්ථාව උදාවනු ඇත.

---

## සී.ස. ලංකාක්ලියර් (පුද්) සමාගම පිළිබඳව

ලංකාක්ලියර් යනු ශ්‍රී ලංකාවේ වඩාත්ම සාර්ථක රාජ්‍ය හා පෞද්ගලික අංශ සම්බන්ධ වූ ව්‍යාපාරයක් ලෙස හැඳින්විය හැක. 2002 දී ශ්‍රී ලංකා ඔටොමේටඩ් ක්ලියරිං හවුස් (SLACH) ආයතනයේ වගකීම් ලංකාක්ලියර් ආයතනයට පැවරීමත් සමග පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාවත්, ක්‍රියාශීලී බවත්, රාජ්‍ය සේවයේ ස්ථාවරත්වයත්, සුරක්ෂිතභාවයත් මුසුකරමින් බැංකු ක්ෂේත්‍රයට සුවිශේෂී වූ ප්‍රතිලාභ රැසක් සළසා දී ඇත.

බැංකු ක්ෂේත්‍රයට සේවා සපයන නිපැයුම් රාශියක් පදනම් කර කාර්යක්ෂමව ගෙවීම් කිරීම පහසු කරවන සේවා රාශියක් ලංකාක්ලියර් විසින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවේ කොතැනකින් චෙක්පතක් බැංකුගත කළ ද, පසුදින එය නිෂ්කාශනය වීම සඳහා පහසුකම් සලසන චෙක් ඉමේජිං ඇන්ඩ් ට්‍රංකේෂන් සිස්ටම් (CITS) සහ අධි ආරක්ෂිත පසුබිමක් තුළ අන්තර්ජාලය ඔස්සේ එදිනම බැංකු අතර මුදල් හුවමාරු කර ගැනීම සඳහා වූ ශ්‍රී ලංකා ඉන්ටබැන්ක් පේමන්ට් සිස්ටම් (SLIPS) යනුවෙන් හැඳින්වෙන ඉලෙක්ට්‍රොනික පද්ධතිය මීට ඇතුලත් වේ. මේ අතර, ලංකාව තුළදී නිෂ්කාශනය කළ හැකි ඇමරිකානු ඩොලර් බැංකු අණකර නිෂ්කාශනය කිරීමේ ක්‍රමය හඳුන්වාදීම තුළින් පාරිභෝගයින්ට වාසි රැසක් ලබාදුන් අතර බැංකු කාර්යක්ෂමතාව ද ඉහළ නැංවීය.

මූල්‍ය ක්ෂේත්‍රය සඳහා ඩිජිටල් සුරැකුම් සහතිකයක් ලබාදීමේ වගකීම භාරගෙන අන්තර්ජාලය ඔස්සේ කෙරෙන ගනුදෙනු සඳහා අධි ආරක්ෂිතභාවයක අවශ්‍යතාව ද LankaSign තුළින් සමාගම විසින් සපුරාදී ඇත.

දීර්ඝ කාලීන ආයෝජනයන් හා නවීකරණයේ වාසි බැංකු ක්ෂේත්‍රයටත් මහජනතාවටත් එකසේ ලබාදීමෙන් ලංකාක්ලියර් සමාගම තම වගකීම් ඉටු කරන අතර එමගින් ජාතියේ ප්‍රධානතම ගෙවීම් පද්ධති යටිතල පහසුකම් සපයන්නා ලෙස තම ප්‍රමුඛත්වය තහවුරු කර ගනිමින් සිටී.

---

**වැඩි විස්තර සඳහා:**

හර්ෂ වනිගතුංග මහතා
තොරතුරු තාක්ෂණ හා මෙහෙයුම් නියෝජ්‍ය සමාන්‍යාධිකාරී
සී.ස. ලංකා ක්ලියර් (පුද්) සමාගම
18 වන මහළ, ලංකා බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල,
ලංකා බැංකු චතුරස්‍රය,

ලංකා බැංකු මාවත,
කොළඹ 01.

දුරකතන : 011-2356960
0777 263150 (ජංගම)
ෆැක්ස් : 011-2544346